# ශ්‍රී ලංකාවේ ශිලා ලේඛනයන්හි සඳහන් ආගමික කටයුතු සම්බන්ධ වෘත්තීන් පිළිබඳ අධ්‍යයනයක්

සී.කේ.චානක ප්‍රදීප් කුමාර*

ආගමක් යනුවෙන් සරලව හඳුන්වනු ලබන්නේ මිනිසුන්ගේ ජීවන රටාව සකස් කරන යම් දැනුම් පද්ධතියකි. එහි අඩංගු දැනුම, වචන, රූප, සංකේත, කතන්දර ආදි වශයෙන් පවත්වාගෙන යනු ලබයි. ඒ දැනුම පවත්වා ගෙන යාමට ඒ ඒ සමාජ විසින් තෝරාගත් පිරිසක් ද සිටී. බොහෝවිට ආගමික දැනුමේ ඒකාධිකාරිත්වය ඔවුන් සතු වේ. වර්තමානයේ මෙන්ම අතීතයේ ද ආගමික කටයුතු සම්බන්ධ තනතුරු නිර්මාණය වී තිබේ. ඒ අනුව මෙමගින් අධ්‍යයනය කරනුයේ ශිලා ලේඛන ඇසුරින් ශ්‍රී ලංකාවේ ආගමික කටයුතු හා සම්බන්ධ වෘත්තීන් හා ඒවායේ වගකීම් තත්කාලීන සමාජයේ කුමන ආකාරයෙන් දිස්වී ද යන්න පිළිබඳවය.

ශ්‍රී ලංකාවේ ශිලා ලේඛන අධ්‍යයන කරන විට අනුරාධපුර, පොළොන්නරු යන යුගයන්හි පැවති වෘත්තීන් රැසක් පිළිබඳ තොරතුරු අනාවරණය කරගත හැකි වේ. එම තොරතුරුවලට අනුව විහාරාරාම පාලනය කිරීමේ අවශ්‍යතාවයත්, සමාජය සංකීර්ණත්වයට පත්වීමත් යනාදී වූ හේතු සාධක නිසා මෙම තනතුරු නාම ඇති වූ බව පැහැදිලිය. විහාරාරාම සංඝයා වහන්සේලා විසින් ම පාලනය කර ඇති අතර ගිහියන් එයට අවශ්‍ය සහාය ලබා දෙනු ලැබූ අතර අනුරාධපුර යුගයේ අවසාන කාලයෙහි ආරාම හා ඉඩකඩම් පාලනය කළ පිරිස් ප්‍රධාන වශයෙන් කොටස් තුනකට බෙදා දැක්විය හැකිය. මහබිත් සග් හිමියන්, වෙහෙර් කැමියන් හා වෙහෙර් දසුන් යනුවෙන් ඔවුන් විසින් හඳුන්වා ඇත. දසවන සියවස වන විට විහාර ඉඩකඩම් හා දේපල පාලනය කිරීම පිළිබඳ නීතිරීති දැක්වෙන කතිකාවත් රාශියක් අන්තර්ගත වේ. අනුරාධපුර යුගයේ මුල්කාලයේ සිට පොළොන්නරු යුගය දක්වා ශිලා ලේඛනවල විහාරාරාම පාලනය කළ වෘත්තිකයන් පිරිසක් සිටි බවත්, පූජනීය වස්තූන් වූ ජය ශ්‍රී මහා බෝධිය, ශ්‍රී දළදා වහන්සේ ආදියෙහි පාලන කටයුතු කිරීම සඳහා සංඝයා වහන්සේලාට අමතරව විශේෂයෙන් ම පත් වූ ගිහි කැපකරු පිරිසක් ද සිටි බව තහවුරු වේ. ඒ බව වංශකතා හා සාහිත්‍ය ග්‍රන්ථවලින් ද පැහැදිලි කරගත හැකිය. ශිලා ලේඛනවලින් හෙළිවන වෘත්තීන් දෙස බලන විට දේශපාලනික, ආර්ථික මෙන්ම ආගමික කටයුතු සම්බන්ධ වෘත්තීන්හි අතීත ජනයා නියලී ඇත.

ප්‍රමුඛ පද- ශිලා ලේඛන, ආගම, වෘත්තීන්, යුතුකම්, වගකීම්

* ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය cpkumara555@gmail.com